# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2009 අංක 38 දරන ජාතික වෘත්තීය ආරක්ෂණ සහ සෞඛ්‍ය පිළිබඳ ආයතනය පනත

---

**[සහතිකය සටහන් කළේ 2009 ජූලි මස 23 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2009 ජූලි මස 24 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

**මිළ :** රු. 11.00 යි. **තැපැල් ගාස්තුව :** රු. 5.00 යි.

**2009 අංක 38 දරන ජාතික වෘත්තීය ආරක්ෂණ සහ සෞඛ්‍ය පිළිබඳ ආයතනය පනත**

[සහතිකය සටහන් කළේ 2009 ජූලි මස 23 වන දින]

එල්. ඩී.— ඕ. 24/2007.

**වෘත්තීය ආරක්ෂණ සහ සෞඛ්‍ය ප්‍රමිතීන් පිළිබඳ ප්‍රතිපත්තියක් නිර්මාණය කිරීම සඳහා ජාතික වෘත්තීය ආරක්ෂණ සහ සෞඛ්‍ය පිළිබඳ ආයතනයක් පිහිටුවීම සඳහා ද ; සේවායෝජකයන් සහ සේවාදායකයන් යන දෙපාර්ශ්වයම ආරක්ෂා කිරීම සඳහා සියලු සේවා ස්ථානවල වෘත්තීය ආරක්ෂණය සහ සෞඛ්‍ය පිළිබඳ පරිසරයක් නිර්මාණය කිරීම සඳහා සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

1. මේ පනත 2009 අංක 38 දරන ජාතික වෘත්තීය ආරක්ෂණ සහ සෞඛ්‍ය පිළිබඳ ආයතනය පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් නියම කරනු ලබන (මෙහි මින්මතු “නියමිත දිනය” යනුවෙන් සඳහන් කරනු ලබන) දිනයක සිට ක්‍රියාත්මක වන්නේ ය.

## I වන කොටස
## ජාතික වෘත්තීය ආරක්ෂණ සහ සෞඛ්‍ය පිළිබඳ ආයතනය පිහිටුවීම

ජාතික වෘත්තීය ආරක්ෂණ සහ සෞඛ්‍ය පිළිබඳ ආයතනය පිහිටුවීම.

2. (1) ජාතික වෘත්තීය ආරක්ෂණ සහ සෞඛ්‍ය පිළිබඳ ආයතනය යනුවෙන් හඳුන්වනු ලබන (මෙහි මින්මතු “ආයතනය” යනුවෙන් සඳහන් කරනු ලබන) ආයතනයක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) ආයතනය, (1) වන උපවගන්තියෙන් ඊට දී ඇති නාමයෙන් සංස්ථාවක් වන අතර, ඊට අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් තිබිය යුතු අතර, එකී සංස්ථාපිත නාමයෙන් එය විසින් ද එයට විරුද්ධව ද නඩු පවරනු ලැබිය හැකි ය.

ආයතනයේ පොදු පරමාර්ථ.

3. (1) ආයතනයේ පොදු පරමාර්ථ විය යුත්තේ —

(අ) සේවායෝජකයන්ගේ සහ සේවාදායකයන්ගේ ආරක්ෂාව සහ රැකියාවේ ස්වභාවය සැලකිල්ලට ගනිමින් ඒ සේවායෝජකයන් සහ සේවාදායකයන් යන

2-PL 003677 —3,500 (2009/02)

දෙපාර්ශ්වයේම සේවා පරිසරය සම්බන්ධයෙන් වෘත්තීය ආරක්ෂණ සහ සෞඛ්‍ය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීමේ දී රජයට උපදෙස් දීම;

(ආ) සේවා ස්ථානවල දී ඇතිවිය හැකි, ක්‍රියාවට අදාළව සිදුවන හදිසි අනතුරු සහ තුවාල වැළැක්වීම සඳහා ගත යුතු පියවර සම්බන්ධයෙන් රජයට උපදෙස් දීම;

(ඇ) වෘත්තීය ආරක්ෂණ සහ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ විමර්ශන අධ්‍යාපන වැඩසටහන් සමීක්ෂණ සහ පර්යේෂණ පැවැත්වීම කරගෙන යාම සහ ඒවාට සහාය දීම;

(ඈ) උපකරණ, අන්තරායදායක ද්‍රව්‍ය, භෞතික, රසායනික හෝ ජීව විද්‍යාත්මක කාරක හෝ නිෂ්පාදන හෝ වෙනත් යම් අන්තරායකාරී ද්‍රව්‍ය නිවැරදිව භාවිත කිරීම පිළිබඳ යම් ආයතනයකට හෝ තැනැත්තකුට උපදේශන සේවා සැපයීම;

(ඉ) වෙනත් යම් ආයතනයක් හෝ ශ්‍රී ලංකාවේ හෝ පිටරටක විශ්වවිද්‍යාලයක් සමග සහයෝගීතාවයෙන් හෝ ආයතනය විසින් වෘත්තීය ආරක්ෂණය සහ සෞඛ්‍ය පිළිබඳ සහ ආශ්‍රිත විෂයයන් පිළිබඳ දැනුම සහ පුහුණුව අවශ්‍ය කරන සේවා නියුක්තයන්ට, පදිංචිකරුවන්ට, සේවකයන්ට හෝ වෙනත් යම් තැනැත්තකුට අධ්‍යාපනය සහ අවශ්‍ය පුහුණුව ලබා දීම සහ ඒ අධ්‍යාපනය හෝ පුහුණුව නිම කිරීමෙන් පසු සහතික පත්‍ර හෝ ඩිප්ලෝමා ප්‍රදානය කිරීම ;

(ඊ) උපකරණ, අන්තරායදායක ද්‍රව්‍ය, භෞතික, රසායනික, ජීව විද්‍යාත්මක කාරක හෝ නිෂ්පාදන නිවැරදිව භාවිත කිරීම පිළිබඳ සහ මනෝ සමාජ අන්තරායන් සහ හඳුනා ගත් අන්තරායන් වැළැක්වීම පිළිබඳ, අවශ්‍ය කරන සේවාවන් සැපයීම;

(උ) (i) වෘත්තීය ආරක්ෂණ සහ සෞඛ්‍යයට අදාළ වන කාරණාවල දී ප්‍රමිති, සංකේත, පරිචය සහ නියමු උපදේශන සම්බන්ධයෙන් නීතිමය අවශ්‍යතා පිළිබඳ අමාත්‍යවරයාට උපදෙස් දීම;

(ii) වැඩ පිළිබඳ ක්‍රියාමාර්ගය, තහනමකට, සීමා කිරීමකට හෝ අධීක්ෂණයකට යටත් කරනු ලැබීමකට නිරාවරණය වන්නා වූ ද්‍රව්‍ය සහ කාරක ඇගයීම සහ නිශ්චය කිරීම;

(ඌ) වෘත්තීය ආරක්ෂණය සහ සෞඛ්‍යයට අදාළ වන තොරතුරු එකතු කිරීම, සකස් කිරීම, ව්‍යාප්ත කිරීම සහ ප්‍රචාරණය කිරීමට භාර ගැනීම සහ එයට සහයෝගය දැක්වීම;

(එ) වෘත්තීය ආරක්ෂණය සහ සෞඛ්‍ය කටයුතුවලට සම්බන්ධ සාකච්ඡා, සම්මන්ත්‍රණ, වැඩමුළු, ලිපි, රචනා ඇතුළත් සාරසංග්‍රහ හෝ වෙනත් සමාන වැඩසටහන් සංවිධානය කිරීම, පත්‍ර පළ කිරීම හෝ ඒවාට දායකත්වය සැපයීම;

(ඒ) වෘත්තීය ආරක්ෂණය සහ සෞඛ්‍ය පිළිබඳ අන්තර් අමාත්‍ය ව්‍යාපෘති වැඩසටහන් සහ ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීම;

(ඔ) වෘත්තීය ආරක්ෂණය සහ සෞඛ්‍ය පිළිබඳ පරිචය ප්‍රවර්ධනය කිරීමේ සහ වැඩි දියුණු කිරීමේ කාර්යය සඳහා පුස්තකාල සහ විද්‍යාගාර පිහිටුවා පවත්වාගෙන යාම;

(ඕ) පර්යේෂණ සහ විශේෂ විද්‍යාගාර වැඩි දියුණු කිරීම;

(ක) වෘත්තීය ආරක්ෂණය සහ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ජාතික සහ අන්තර් ජාතික ආයතන, විශ්වවිද්‍යාල හෝ වෙනත් යම් සංවිධාන සමග සබඳතා ඇති කර ගැනීම සහ සම්බන්ධතා සහ ජාල පිහිටුවීම ; සහ

(ග) වෘත්තීය ආරක්ෂණය සහ සෞඛ්‍ය ක්ෂේත්‍රය පිළිබඳ ජාතික ප්‍රමිති පිහිටුවීම.

(2) (1) වන උපවගන්තියේ (උ) ඡේදයේ නිශ්චිතව දක්වා ඇති කාරණාවලට අදාළ උපදෙස්වලට අමතරව (1) වන උපවගන්තියේ නිශ්චිතව සඳහන් කර ඇති කාරණා සියල්ල හෝ ඉන් කිසිවක් සම්බන්ධයෙන් හෝ අමාත්‍යවරයා විසින් කලින් කල ආයතනය වෙත යොමු කරනු ලැබිය හැකි වෙනත් යම් කාරණා සම්බන්ධයෙන් ආයතනය විසින් අමාත්‍යවරයාට උපදෙස් ලබා දිය යුතු ය.

ආයතනයේ බලතල.

4. (1) මේ පනතේ 3 වන වගන්තියේ නිශ්චිතව සඳහන් කර ඇති කර්තව්‍ය අතරින් කිසිවක් හෝ ඒ සියල්ලම හෝ ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි පරිදි වූ සියලු කටයුතු සිදු කිරීමට ආයතනයට බලතල තිබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය මගින් එයට පවරන ලද බලතලවල ව්‍යාප්තියට අගතියක් නොවන පරිදි ආයතනය විසින් —

(අ) සේවා ස්ථානවල හෝ වැඩ කරන පරිසරය තුළ පවත්වා ගෙන යා යුතු ප්‍රමිති පිළිබඳව, කලින් කලට තක්සේරු කිරීම සහ ඇගයීම සහ ඒ ප්‍රමිතීන්ට අදාළ ව්‍යවස්ථාදායක අවශ්‍යතා පිළිබඳ අමාත්‍යවරයාට උපදෙස් දීම සහ වෘත්තීය ආරක්ෂණය සහ සෞඛ්‍ය සහ වැඩ කිරීමේ පරිසරයට අදාළ සියලු කාරණා පිළිබඳ උපදේශන සේවා ලබා දීමට අවශ්‍ය වන අවස්ථාවක දී පදිංචිකරුවකුට, සේවකයකුට හෝ වෙනත් යම් තැනැත්තකුට එසේ උපදේශන සේවා සැපයීම ;

(ආ) ආයතනය විසින් වෙනත් යම් ආයතනයකට, සංවිධානයකට හෝ වෙනත් යම් තැනැත්තකුට ලබා දෙන ලද සේවාවන් හෝ සපයන ලද පහසුකම් හෝ උපකරණ සඳහා ගාස්තුවක් පැනවීම හෝ අය කිරීම ;

(ඇ) ආයතනයේ කර්තව්‍ය ඉටු කිරීමේ කාර්යය සඳහා නිශ්චල හෝ චංචල දේපළ කිසිවක් අත්කර ගැනීම, දැරීම, බද්දට හෝ කුළියට දීම හෝ ගැනීම, උකස් කිරීම, ඔඩපනය, විකිණීම හෝ අන්‍යාකාරයකින් නියාදනය කිරීම ;

(ඈ) ආයතනයේ කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි යම් සියලු ගිවිසුම් හෝ කොන්ත්‍රාත්වලට ආයතනය විසින් හෝ ආයතනය විසින් තත්කාර්යය සඳහා බලය දෙන ලද වෙනත් යම් නිලධරයකු හෝ අනුයෝජිතයකු විසින් ඇතුළත් වී ඒවා ක්‍රියාත්මක කිරීම,

කරනු ලැබිය හැකි ය.

## II වන කොටස
## ආයතනයේ පාලක සභාව

පාලක සභාවේ සංයුතිය.

5. (1) (මෙහි මින්මතු "සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) මේ පනතේ විධිවිධානවලට යටත්ව පවරනු ලැබිය යුතු ආයතනයේ බලතල සහ කාර්යය ඇතුළත් වන්නා වූ පාලක සභාවක් ආයතනයට තිබිය යුතු ය.

(2) සභාව —

(අ) (මෙහි මින් මතු "පත් කළ සාමාජිකයන්" යනුවෙන් සඳහන් කරනු ලබන) අමාත්‍යවරයා විසින් පත් කළ සාමාජිකයන් හත් දෙනකුගෙන් —

(i) සේවායෝජකයන්ගේ සංවිධානයේ නියෝජිතයන් දෙදෙනකුගෙන් ;

(ii) සේවක සංවිධාන නියෝජනය කරන්නා වූ දෙදෙනෙක් ;

(iii) වෘත්තීය ආරක්ෂණ සහ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ විශිෂ්ටත්වයක් දක්වා ඇති සහ ආරක්ෂණය හෝ සෞඛ්‍ය පිළිබඳ කර්තව්‍යය ඇතුළත් වන්නා වූ පනතක විධිවිධාන යටතේ පිහිටුවන ලද ආයතනයක සාමාජිකයන් විය යුතු තැනැත්තන් තුන් දෙනකුගෙන්,

සමන්විත විය යුතු ය.

(ආ) නිලබලයෙන් පත් වූ පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය:—

(i) සභාවේ සභාපතිවරයා විය යුතු, කම්කරු විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යංශයේ ලේකම්වරයා ලෙස තත්කාලයේ ධුරය දරන තැනැත්තා;

(ii) සභාවේ උපසභාපතිවරයා විය යුතු කම්කරු කොමසාරිස් ජනරාල්වරයා ලෙස තත්කාලයේ ධුරය දරන තැනැත්තා;

(iii) කම්කරු කොමසාරිස් (කාර්මික ආරක්ෂණ) ලෙස තත්කාලයේ ධුරය දරන තැනැත්තා;

(iv) කම්කරු කොමසාරිස් (වෘත්තීය සනීපාරක්ෂාව) ලෙස තත්කාලයේ ධුරය දරන තැනැත්තා;

(v) මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරන ලද ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් තනතුරකට පහළ තනතුරක නිලධරයකු නොවන එක් සාමාජිකයකු ;

(vi) සෞඛ්‍ය විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කළ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් තනතුරකට පහළ නොවන තනතුරක නිලධරයකු වන්නා වූ එක් සාමාජිකයකු;

(vii) කර්මාන්ත විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කළ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් තනතුරකට පහළින් නොවන නිලධරයකු වන්නා වූ එක් සාමාජිකයකු;

(viii) කෘෂිකර්ම විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කළ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් තනතුරකට පහළ තනතුරක නොවන නිලධරයකු වන්නා වූ එක් සාමාජිකයකු ; සහ

(ix) ආයතනයේ අධ්‍යක්ෂ - ජනරාල්වරයා ලෙස තත්කාලයේ ධුරය දරන තැනැත්තකු.

සභාවේ ලේකම්වරයා.

**6.** සභාවේ වාර්තා සකස් කර පවත්වාගෙන යාම සඳහා සභාවට ලේකම්වරයකු සිටිය යුතු ය. සභාව විසින් ආයතනයේ අධ්‍යක්ෂවරයකු, ලේකම්වරයා ලෙස පත් කරනු ලැබිය යුතු ය.

සභාවේ සාමාජිකයන්ගේ ධුර කාලය.

**7.** (1) සභාවේ සෑම පත් කළ සාමාජිකයකු ම මරණය, ඉල්ලා අස්වීම හෝ ඉවත්වීම නිසා කලින් ස්වකීය ධුරයෙන් ඉවත් වී ඇත්නම් මිස ඔහු පත් කළ දින සිට වසර තුනක කාලයක් සඳහා ධුරය දැරිය යුතු අතර, ඔහු ධුරයෙන් ඉවත් කරනු ලැබ ඇත්නම් මිස ඔහු නැවත පත් කරනු ලැබීමට සුදුසුකම් ලැබිය යුතු ය.

(2) පත් කළ යම් සාමාජිකයකුට ඉල්ලා අස්වීම සඳහා අමාත්‍යවරයා අමතා යවනු ලබන ලිපියකින් ඕනෑම අවස්ථාවක ඉල්ලා අස්විය හැකි ය. ඒ ඉල්ලා අස්වීම, අමාත්‍යවරයා විසින් එය ලිඛිතව පිළිගැනීමෙන් පසු බලාත්මක විය යුතු ය.

(3) අයහපත් සෞඛ්‍ය, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනත් යම් හේතුවක් නිසා ස්වකීය ධුරයේ කර්තව්‍ය ඉටු කිරීමට යම් පත් කළ සාමාජිකයකු තාවකාලිකව අපොහොසත් වන අවස්ථාවක දී, අමාත්‍යවරයා විසින් ඔහු වෙනුවට ක්‍රියා කිරීමට වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

(4) අමාත්‍යවරයා විසින් අදාළ විෂයය භාර අමාත්‍යවරයා විමසා, එසේ කිරීම සුදුසු යයි සිතන්නේ නම් අවශ්‍ය අවස්ථාවක දී යම් පත් කළ සාමාජිකයකු ඒ සඳහා හේතු දක්වා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි අතර, ඉන්පසුව ඒ සාමාජිකයා ස්වකීය ධුරය හිස් කරනු ලැබ ඇති ලෙසට සලකනු ලැබිය යුතු ය.

(5) යම් සාමාජිකයකු ඉල්ලා අස්වීම හෝ ඉවත් කිරීමෙන් ධුරය හිස්වන අවස්ථාවක දී අමාත්‍යවරයා විසින් ඔහු වෙනුවට කටයුතු කිරීමට යම් සුදුසු තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය. එසේ පත් කරන ලද යම් සාමාජිකයකු ඔහු අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයෙන් නොගෙවී ඇති කාලය සඳහා ධුර දැරිය යුතු ය.

සභාවේ සාමාජිකත්වය සඳහා වූ නුසුදුසුකම්.

8. යම් තැනැත්තකු —

(1) පාර්ලිමේන්තුවේ, පළාත් සභාවක හෝ යම් පළාත් පාලන ආයතනයක සභිකයකු වේ නම් හෝ සභිකයකු බවට පත් වන්නේ නම් ; හෝ

(2) ශ්‍රී ලංකාව තුළ හෝ වෙනත් යම් රටක් තුළ බලාත්මක වන යම් නීතියක් යටතේ ඔහු සිහිවිකල තැනැත්තකු බවට තීරණය කරනු ලැබුවහොත් හෝ ප්‍රකාශයට පත් කරනු ලැබුවහොත් ; හෝ

(3) ශ්‍රී ලංකාව තුළ හෝ වෙනත් රටක් තුළ බලපවත්වන යම් නීතියක් යටතේ බුන්වත්භාවයට හෝ බංකොලොත්භාවයට පත්ව ඇතැයි ප්‍රකාශයට පත් කරනු ලැබ නිදහස නොලත් බුන්වත්භාවයට හෝ බංකොලොත්භාවයට පත් තැනැත්තකු වේ නම් ; හෝ

(4) ශ්‍රී ලංකාව තුළ හෝ වෙනත් යම් රටක් තුළ යම් අධිකරණයක් මඟින් පනවන ලද බන්ධනාගාරගත කිරීමේ සිර දඬුවමක් විඳිමින් සිටින හෝ විඳ ඇති තැනැත්තකු වේ නම්,

ඒ තැනැත්තා සභාවේ පත් කළ සාමාජිකයකු ලෙස පත් කරනු ලැබීමට හෝ අඛණ්ඩව කටයුතු කරගෙන යාමට නුසුදුසු තැනැත්තකු විය යුතු ය.

රැස්වීම්.

**9.** (1) සභාවේ සභාපතිවරයා විසින් අවම වශයෙන් සෑම මාස තුනකට වරක්වත් සභාවේ රැස්වීම් කැඳවනු ලැබිය යුතු ය.

(2) සභාවේ සාමාජිකයන් හත් දෙනකු විසින් සභාවේ විශේෂ රැස්වීමක් කැඳවීම සඳහා ලිඛිතව ඉල්ලා සිටීමෙන් පසු, දින දාහතරක් ඇතුළත සභාපතිවරයා විසින් විශේෂ රැස්වීමක් කැඳවනු ලැබිය යුතු අතර, ඒ රැස්වීමේ දී සාකච්ඡා කළ යුතු කරුණු පිළිබඳ ඒ දැන්වීමේ නිශ්චිතව සඳහන් කරනු ලැබිය යුතු ය.

(3) එක් එක් සාමාජිකයාට සභාවේ සෑම රැස්වීමක් පිළිබඳව ම ලිඛිත දැන්වීමක් දින හතකටවත් පෙර සභාපතිවරයා විසින් ලබා දිය යුතු අතර, ඒ රැස්වීමේ සාකච්ඡා කළ යුතු කරුණු පිළිබඳ ඒ දැන්වීමේ නිශ්චිතව සඳහන් කරනු ලැබිය යුතු ය.

(4) සභාපතිවරයා නොපැමිණි අවස්ථාවක දී, උපසභාපතිවරයා විසින් සභාවේ සියලු රැස්වීම්වල මුලසුන දැරිය යුතු ය.

(5) සභාවේ යම් රැස්වීමක ගණපූරණය සාමාජිකයන් හත් දෙනකු විය යුතු ය.

(6) සියලු ප්‍රශ්නවල දී සභාව විසින් ගන්නා තීරණ පැමිණ ඡන්දය දෙන්නා වූ සාමාජිකයන්ගේ බහුතර කැමැත්තෙන් නිශ්චය කරනු ලැබිය යුතු ය. ඡන්ද සමාන වන අවස්ථාවක දී, මුලසුන දරන නිලධරයාට තීරක ඡන්දයක් ප්‍රකාශ කළ හැකි ය.

(7) සභාවේ සෑම රැස්වීමක ම රැස්වීම් කටයුතු පිළිබඳ වාර්තා කරනු ලැබිය යුතු ය.

(8) මෙහි විධිවිධානවලට යටත්ව, සභාව විසින් එහි රැස්වීම්වල දී අනුගමනය කළ යුතු ක්‍රියාපටිපාටිය නිශ්චය කරමින් රීති සාදනු ලැබිය හැකි ය.

(9) මණ්ඩලයේ කිසිදු ක්‍රියාවක්, තීරණයක් හෝ රැස්වීම් කටයුත්තක් සභාවේ යම් පුරප්පාඩුවක් හෝ එහි සාමාජිකයකු ඡන්දයෙන් පත් කිරීමේ දී හෝ නම් කිරීමේ දී යම් දෝෂයක් පැවතීම හේතුවෙන් ම බල රහිත නොවිය යුතු ය.

ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා.

**10.** (1) වෘත්තීය ආරක්ෂණ සහ සෞඛ්‍ය ප්‍රතිපත්ති පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් ඇති සහ වෘත්තීය ආරක්ෂණය සහ සෞඛ්‍ය ප්‍රතිපත්ති පරිචයෙහි අවම වශයෙන් වසර දහයක පළපුරුද්දක් සමඟ ප්‍රමාණවත් දැනුමක් ඇති (මෙහි මින් මතු "අධ්‍යක්ෂ - ජනරාල්වරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) ආයතනයේ අධ්‍යක්ෂ - ජනරාල්වරයා විය යුතු තැනැත්තකු සභාව විසින් පත් කරගනු ලැබිය යුතු ය.

(2) අධ්‍යක්ෂ - ජනරාල්වරයා ආයතනයේ පූර්ණකාලීන නිලධරයකු විය යුතු අතර, සභාවේ විධානවලට යටත් වෙමින් සභාවේ තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා වගකියනු ලැබිය යුතු ය. තව ද, ඔහු වෙත පවරනු ලැබිය හැකි වෙනත් යම් කාර්යය ද ඉටු කරනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ පත්කරන ලද අධ්‍යක්ෂ-ජනරාල්වරයා සභාව විසින් ඒ සඳහා හේතු දක්වා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

ආයතනයේ අධ්‍යක්ෂවරු.

**11.** ආයතනයේ කාර්යක්ෂම පරිපාලනය සඳහා අවශ්‍ය විය යුතු පරිදි ආයතනයේ අධ්‍යක්ෂවරු වශයෙන් යම් තැනැත්තන් සංඛ්‍යාවක් සභාව විසින් පත් කරනු ලැබිය යුතු ය. එසේ පත් කරනු ලැබූ තැනැත්තන් එවැනි අධ්‍යක්ෂවරයකු ලෙස ඒ හා සමාන කර්තව්‍යයන්ගෙන් යුත් තනතුරක වසර හතක පළපුරුද්දක් සතු විය යුතු අතර එවැනි තනතුරකට අදාළ වන්නා වූ ප්‍රමාණවත් දැනුමකින් ද සමන්විත විය යුතු ය.

කාර්ය මණ්ඩලය පත් කිරීම.

**12.** (1) මේ පනත යටතේ එහි බලතල, කාර්යය සහ කර්තව්‍ය කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි යයි තීරණය කරනු ලැබිය හැකි පරිදි වූ යම් නිලධරයන් සහ සේවකයන් ආයතනය විසින් ආයතනයේ කාර්ය මණ්ඩලයට පත් කරනු ලැබිය හැකි ය.

(2) ආයතනය විසින් මේ පනතේ වෙනත් විධිවිධානවලට යටත්ව—

(අ) ආයතනයේ නිලධරයන් සහ සේවකයන්ගේ විනය පාලනය ක්‍රියාත්මක කිරීම;

(ආ) කාර්යය මණ්ඩලයේ වේතන, පඩිනඩි හෝ වෙනත් පාරිතෝෂික ගණනය කිරීම; සහ

(ඇ) ආයතනයේ නිලධරයන්ගේ සහ සේවකයන්ගේ සේවා කාලය සහ සේවා කොන්දේසි නිශ්චය කිරීම,

කළ හැකි ය.

ආයතනයට රජයේ නිලධරයන් පත් කිරීම.

**13.** (1) සභාවේ ඉල්ලීම පරිදි යම් රජයේ නිලධරයකු ඒ නිලධරයාගේ කැමැත්ත සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ කැමැත්ත ඇතිව සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් කාලසීමාවක් සඳහා එවැනිම කැමැත්ත ඇතිව, ආයතනයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබීම හෝ ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කිරීම කරනු ලැබීම කළ හැකි ය.

(2) යම් රජයේ නිලධරයකු ආයතනයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලබන අවස්ථාවක දී, ඒ නිලධරයා සම්බන්ධයෙන් 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ කරගනු ලැබිය යුතු ය.

(3) යම් රජයේ නිලධරයකු ආයතනයේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලබන අවස්ථාවක දී ඒ නිලධරයා සම්බන්ධයෙන් 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ කරගනු ලැබිය යුතු ය.

(4) යම් නිශ්චිත කාලයක් සඳහා රජයට සේවය කිරීමට එකඟ වෙමින් රජය සමග ගිවිසුමකට එළඹ ඇති යම් තැනැත්තකු ආයතනය විසින් සේවයේ නියුක්ත කර ඇති අවස්ථාවක, ඒ තැනැත්තා විසින් ආයතනයට සිදු කළ සේවා කාලය ඒ ගිවිසුම යටතේ ඒ තැනැත්තා විසින් බැඳීම් ඉටු කිරීමේ කාර්යය සඳහා රජයට කරන ලද සේවාවක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(5) සභාවේ ඉල්ලීම මත, පළාත් පාලන සේවයේ සාමාජිකයකු හෝ යම් පළාත් පාලන ආයතනයක යම් නිලධරයකු ඒ සාමාජිකයාගේ හෝ නිලධරයාගේ හෝ සේවා නියුක්තයාගේ කැමැත්ත ඇතිව, ආයතනය විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් කාලසීමාවක් සඳහා ආයතනයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය; නැතහොත් අවස්ථාවෝචිත පරිදි ආයතනය සහ පළාත් පාලන සේවා උපදේශක මණ්ඩලය හෝ පළාත් පාලන ආයතනය එකඟ විය හැකි පරිදි ඒවාට අදාළ වන විශ්‍රාම වැටුප් හෝ අර්ථසාධක අරමුදල්වලට ඇති අයිතිවාසිකම් ඇතුළුව යම් නියම සහ කොන්දේසි මත එවැනිම කැමැත්ත ඇතිව, ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරවම පත් කරගනු ලැබිය හැකි ය.

(6) මේ වගන්තියේ (5) වන උපවගන්තිය යටතේ ආයතනයේ කාර්ය මණ්ඩලයට යම් තැනැත්තකු තාවකාලිකව පත් කරනු ලබන අවස්ථාවක දී, ඒ තැනැත්තා විසින් කාර්ය මණ්ඩලයේ වෙනත් යම් සාමාජිකයකු පරිදි එම විනය පාලනයට යටත් විය යුතු ය.

**14.** (1) අධ්‍යක්ෂ - ජනරාල්වරයා විසින්, සභාවේ අනුමතය ඇතිව, තමා වෙත මේ පනත යටතේ පනවා ඇති හෝ පවරා ඇති යම් බලතල හෝ කර්තව්‍ය ආයතනයේ යම් නිලධරයකු වෙත ලිඛිතව අභිනියෝජනය කිරීම අවශ්‍ය යයි සලකනු ලබන ඕනෑම අවස්ථාවක, එසේ කළ හැකි අතර, එම නිලධරයා විසින් අධ්‍යක්ෂ-ජනරාල්වරයාගේ යම් විධානයකට හෝ පාලනයට යටත්ව එම බලතල හෝ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම කරනු ලැබිය යුතු ය. බලතල අභිනියෝජනය කිරීම.

(2) එවැනි යම් අභිනියෝජනයක කුමක් සඳහන් වුව ද, ආයතනය විසින් එවැනි යම් බලතල, කාර්යය හෝ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හෝ කිරීම හෝ ඉටු කිරීම නොකඩවා සිදු කළ හැකි ය.

තොරතුරු රැස් කිරීම.

**15.** අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් ආණ්ඩුවේ හෝ පෞද්ගලික අංශයේ ආයතනයක ප්‍රධානියා හෝ පදිංචිකරුවකුට, ලිඛිතව වූ දැන්වීමක් මඟින්, මේ පනත යටතේ ඔහුගේ බලතල සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට සහ ඉටු කිරීමට හැකි වන පරිදි එම දැන්වීමේ නිශ්චිතව දක්වනු ලැබිය හැකි යම් කාලයක් තුළ දී වෘත්තීය ආරක්ෂණය සහ සෞඛ්‍ය සම්බන්ධව එම ආයතනයේ කර්තව්‍යවලට අදාළ සියලු තොරතුරු, එම ආයතනයේ විෂය පථය තුළ ඉදිරිපත් කරන ලෙස නියම කළ හැකි ය.

## III වන කොටස

### ආයතනයේ අරමුදල් සහ මුදල්

ආයතනයේ අරමුදල.

**16.** (1) ආයතනයට (මෙහි මින් මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) ස්වකීය අරමුදලක් තිබිය යුතු ය.

(2) අරමුදලට පහත සඳහන් මුදල් ගෙවනු ලැබිය යුතු ය:—

(අ) ආයතනයේ භාවිතයට පාර්ලිමේන්තුව විසින් කලින් කලට වෙන් කරනු ලැබිය හැකි සියලු මුදල් සහ රජය විසින් ප්‍රදාන, ණය හෝ අන්‍යාකාරයකින් ආයතනයට සපයන යම් අරමුදල් ;

(ආ) මේ පනත යටතේ අය කරගත් සහ රැස් කරගත් යම් සෙස් බදු ආදායම්;

(ඇ) ගාස්තු සහ අයකිරීම් මාර්ගයෙන් ආයතනය විසින් ලබාගත හැකි සියලු මුදල්;

(ඈ) ආයතනය විසින් කරන ලද යම් ආයෝජනයක ආදායමක් ලෙස ආයතනය විසින් ලබාගත හැකි සියලු මුදල් ;

(ඉ) ආයතනය විසින් එහි බලතල, කාර්යය සහ කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම තුළින් ලබාගත හැකි සියලු මුදල්; සහ

(ඊ) ශ්‍රී ලංකාවෙන් හෝ ඉන් බැහැරව ණය, පරිත්‍යාග, ත්‍යාග හෝ ප්‍රදාන යන කවර හෝ මූලාශ්‍රයකින් ආයතනයට ලැබෙන සියලු මුදල්.

(3) අරමුදලෙන් පහත සඳහන් අරමුදල් ගෙවනු ලැබිය යුතු ය:—

(අ) මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි පාලන සභාවේ සාමාජිකයන්ට ගෙවනු ලබන පාරිශ්‍රමික;

(ආ) ආයතනයේ කථිකාචාර්යවරුන්ට, උපදේශකයන්ට, විද්වතුන්ට, නිලධරයන්ට, සේවකයන්ට සහ සේවා නියුක්තයන්ට ගෙවිය යුතු වැටුප්, දීමනා සහ වෙනත් යම් ගාස්තු හෝ ගෙවීම්;

(ඇ) මේ පනත යටතේ ආයතනයේ බලතල, කාර්යය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම වෙනුවෙන් ආයතනය විසින් දරන ලද යම් වියදමක් පියවා ගැනීමට අවශ්‍ය සියලු මුදල්.

මුදල් වර්ෂය සහ ගිණුම් විගණනය.

**17.** (1) ආයතනයේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) ආයතනය විසින් එක් එක් මුදල් වර්ෂය සම්බන්ධයෙන් ලැබීම් සහ ගෙවීම් පිළිබඳ ප්‍රකාශයක්, ආදායම් සහ වියදම් පිළිබඳ ප්‍රකාශයක්, වත්කම් සහ බැරකම් පිළිබඳ ප්‍රකාශයක් සහ එක් එක් ආයෝජනයේ ප්‍රකාශන අගය, මිල දී ගැනීමේ මිල සහ වෙළෙඳපල වටිනාකම දක්වමින් ආයෝජන පිළිබඳ ප්‍රකාශයක් සකස් කිරීමට කටයුතු සැලැස්විය යුතු ය.

(3) රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනයට අදාළ වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන ආයතනයේ ගිණුම් විගණනය සඳහා සහ ඒ සම්බන්ධයෙන් අදාළ කරගනු ලැබිය යුතු ය.

පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු වාර්තා.

**18.** ආයතනය විසින් ආයතනයේ වැඩකටයුතු පිළිබඳ වාර්ෂික වාර්තාවක් සකස් කළ යුතු අතර, ඒ වාර්තා අදාළ වන වර්ෂයට පසුව එළඹෙන වර්ෂය ඉකුත්වීමට පෙරාතුව ඒ වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

## IV වන කොටස

### සාමාන්‍ය

ආයතනයේ රීති.

**19.** ආයතනය විසින්, ආයතනයේ කටයුතු සංවිධානය කිරීම සම්බන්ධයෙන් සහ නිලධරයන්ගේ සහ සේවකයන්ගේ පත් කිරීම්, උසස් කිරීම්, පාරිශ්‍රමික ගෙවීම්, විනය පාලනය සහ ඔවුනට නිවාඩු ප්‍රදානය කිරීම ඇතුළුව එහි නිලධරයන්ට සහ සේවකයන්ට අදාළ වන්නා වූ රීති සාදනු ලැබිය යුතු ය. එම සෑම රීතියක්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය

නියෝග සෑදීමට ඇති බලතල.

**20.** (1) අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබීමට අවශ්‍ය කාරණා සම්බන්ධයෙන් හෝ නියෝග සෑදීමට බලය ඇති කාරණා සම්බන්ධයෙන් මේ පනතේ මූලධර්මවලට සහ විධිවිධානවලට බලාත්මකභාවයක් ලබා දීමේ කාර්යය සඳහා නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරන ලද දිනයේ හෝ එම නියෝගයේ නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යම් පසු දිනයක ඒ නියෝග ක්‍රියාත්මක විය යුතු ය.

(3) සෑම නියෝගයක් ම එය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු ප්‍රායෝගිකව හැකි පහසු ඉක්මනින් අනුමතය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු ය. එසේ අනුමත නොකළ යම් නියෝගයක් ඒ යටතේ කලින් සිදු කරන ලද කිසිවකට අගතියක් නොමැතිව එය අනනුමත දිනයේ සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සැලකිය යුතු ය.

(4) යම් නියෝගයක් එසේ පරිච්ඡින්න කරනු ලබන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කළ යුතු ය.

ආයතනයේ මුද්‍රාව.

**21.** ආයතනයේ මුද්‍රාව, සභාව විසින් කලින් කළ තීරණය කරනු ලැබිය හැකි යම් තැනැත්තකුගේ භාරයේ තිබිය යුතු අතර, සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් ආකාරයකින් එය වෙනස් කරනු ලැබිය හැකි ය. ආයතනයේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී මිස, ආයතනයේ මුද්‍රාව කිසිදු සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට සලකුණක් වශයෙන් ඔවුන් විසින් එකී සාධන පත්‍රයෙහි තම නම් අත්සන් කළ යුතු ය. ආයතනයේ මුද්‍රාව තබනු ලබන සියලුම ලේඛනවල රෙජිස්ටරයක් ආයතනය විසින් පවත්වාගෙන යා යුතු ය.

**22.** අධ්‍යක්ෂ - ජනරාල්වරයා හෝ අධ්‍යක්ෂ - ජනරාල්වරයා විසින් තත්කාර්යය සඳහා බලය පවරන ලද නිලධරයකු හෝ අනුයෝජිතයකු විසින් සියලු සාධාරණ වේලාවන් හි දී යම් වැඩ කරන ස්ථානයකට ඇතුළු වී ආයතනයේ කර්තව්‍ය සහ කාර්යය සියල්ල හෝ කිසිවක් සිදු කිරීමට අවශ්‍ය විය හැකි යම් ක්‍රියා සිදු කිරීම නීත්‍යානුකූල විය යුතු ය. එසේ බලය දෙන ලද නිලධරයකුට හෝ අනුයෝජිතයකුට එම පත් කිරීම හෝ බලය පැවරීම පිළිබඳ නියම කරනු ලැබිය හැකි යම් සහතිකයක් නිකුත් කළ යුතු අතර, මේ පනත යටතේ කර්තව්‍ය හෝ ක්‍රියා කිසිවක් සිදු කිරීම පිණිස යම් වැඩ කරන ස්ථානයක් හෝ පරිශ්‍රයක් නැරඹීමට යාමේ දී අවශ්‍ය වේ නම් ඒ වැඩ බිමේ හෝ පරිශ්‍රයේ වගකීම දරන තැනැත්තාට හෝ පදිංචිකරුට ඒ බලය සහිත සහතිකය ඉදිරිපත් කළ යුතු ය.

ඇතුළුවීමට සහ පරීක්ෂා කිරීමට බලතල.

**23.** යම් නිශ්චල දේපළක් ආයතනයේ යම් නිශ්චිත කාර්යයක් සඳහා අත්කර ගැනීමට අවශ්‍ය වන අවස්ථාවක දී සහ ඒ කාර්යය සඳහා යෝජිත අත්කර ගැනීම පිළිබඳ අනුමතය අමාත්‍යවරයා විසින් නියමයක් ලෙස ගැසට් පත්‍රයේ පළ කරන අවස්ථාවක දී ඒ දේපළ මහජන කාර්යයක් සඳහා අවශ්‍ය කරන දේපළක් ලෙස සලකනු ලැබිය යුතු අතර, (420 වන අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ අත්කර ගනු ලැබිය හැකි ය.

ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ නිශ්චල දේපළ අත්කර ගැනීම.

**24.** (1) ආයතනයට එරෙහිව ඉදිරිපත් කරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩු කටයුත්තක දී ආයතනය විසින් දරන ලද යම් වියදමක් ආයතනයේ අරමුදලින් ගෙවිය යුතු අතර, එවැනි යම් සිවිල් හෝ අපරාධ නඩු කටයුත්තක දී ආයතනය විසින් ලබා ගන්නා ලද හෝ ආයතනයට ගෙවන ලද යම් පිරිවැය ආයතනයේ අරමුදලට බැර කළ යුතු ය.

ආයතනයේ අරමුදලින් ගෙවිය යුතු වියදම්

(2) මේ පනත යටතේ හෝ සභාවේ විධානය මත සභාවේ යම් සාමාජිකයකු හෝ ආයතනයේ යම් නිලධරයකු හෝ සේවකයකු විසින් කරන ලද හෝ කරන ලද බවට උද්දේශිත යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් එම තැනැත්තාට එරෙහිව යම් අධිකරණයක පවරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩු කටයුත්තක දී, එම තැනැත්තා විසින් දරන ලද යම් වියදම්, එම ක්‍රියාව සද්භාවයෙන් කරන ලද බවට අධිකරණය තීරණය කරන්නේ නම්, එම තැනැන්තා විසින් එම වියදම් එම සිවිල් හෝ අපරාධ නඩු කටයුත්තේ දී ලබාගෙන ඇත්නම් මිස, ආයතනයේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**25.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අර්ථ නිරූපනය.

**26.** මෙහි පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතේ කාර්යය සඳහා, "පදිංචිකරු" යන්නෙන්, කළමනාකරණ හෝ පරිපාලන කර්තව්‍ය පවරා ඇති යම් අධිකාරියක් ද ඇතුළුව, රජයේ හෝ වෙනත් යම් පුද්ගලික කාර්ය මණ්ඩලයක, ආයතනයක, රාජ්‍ය සංස්ථාවක හෝ සංස්ථාපිත ආයතනයක, කර්මාන්ත ශාලාවක හෝ වෙනත් කර්මාන්තයක කටයුතු කළමනාකරණය හෝ පරිපාලනය කරන යම් තැනැත්තකු අදහස් වේ.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.